සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Province Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
Second Term Evaluation

ශ්‍රේණිය / தரம் / Grade	11	විෂයය / பாடம் / Subject	කෘෂි හා ආහාර තාක්ෂණය	පත්‍රය / வினாத்தாள் / Paper	I	කාලය / காலம் / Time	පැය 01

- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු හතරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(01) ශ්‍රී ලංකාවේ රබර් වගාව 19 වන සියවස අග භාගයේ දී ආරම්භ කරන ලදී. ඒ අනුව ලංකාවේ පළමු රබර් ගස රෝපණය කරන ලද්දේ,
(1) පේරාදෙනිය උද්භිද උද්‍යානයේ ය.
(2) ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානයේ ය.
(3) හග්ගල උද්භිද උද්‍යානයේ ය.
(4) අගලවත්ත රබර් පර්යේෂණ ආයතනයේ ය.

(02) ජනගහන පැතිකඩෙහි විවිධ වර්ධන අවධි සඳහා පෝෂණය පිළිබඳ ප්‍රකාශ පහත දක්වේ.
A - දරුවෙකු ඉපදී මුල් අවුරුද්ද තුල මොළයේ වැඩීම 90%ක් පමණ සම්පූර්ණ වේ.
B - ළදරු අවධියට වඩා සීඝ්‍ර ශාරීරික හා මානසික වර්ධනයක් ළමා අවධියේ දී සිදුවෙයි.
C - වැඩිහිටි අයෙකුගේ පෝෂණ අවශ්‍යතාව ඔහු නිරතව සිටින රැකියාව මත පදනම් නොවේ.
ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ දක්වෙන පිළිතුර තෝරන්න.
(1) A හා C පමණි.
(2) A හා B පමණි.
(3) B හා C පමණි.
(3) A, B, C යන සියල්ල ම

(03) මැයි මාසයේ සිට සැප්තැම්බර් මාසය පමණ වන තෙක් ශ්‍රී ලංකාවේ බස්නාහිර, මධ්‍යම, සබරගමුව පළාත් වලටත් ගාල්ල, මාතර ප්‍රදේශවලටත් වර්ෂාව ලබාදෙමින් යල කන්නය පෝෂණය කරන්නේ,
(1) ඊසාන දිග මෝසම් වර්ෂාවයි.
(2) සංවහන වර්ෂාවයි.
(3) වාසුළි වර්ෂාවයි.
(4) නිරිත දිග මෝසම් වර්ෂාවයි.

(04) යම් පසක ඇති වැලි, මැටි සහ රොන්මඩ ප්‍රමාණය දැන ගැනීමෙන් එම පසේ පහත දක්වෙන ලක්ෂණ අතුරෙන් කිනම් ලක්ෂණය තීරණය කළ හැකි ද?
(1) පාංශු ව්‍යූහය ය.
(2) පාංශු වයනය ය.
(3) පාංශු උෂ්ණත්වය ය.
(4) පාංශු ජීවීන් ප්‍රමාණය ය.

(05) ශ්‍රී ලංකාවට වසරක් තුළ දී අන්තර් මෝසම් සෘතු දෙකක් ඇති වේ. ඉන් පළමු අන්තර් මෝසම් සෘතුව සිදුවන්නේ කවර මාසවල ද?
(1) සැප්තැම්බර් සිට නොවැම්බර් මාසවල ය.
(2) මාර්තු සිට අප්‍රේල් මාසවල ය.
(3) ජනවාරි සිට මාර්තු මාසවල ය.
(4) අගෝස්තු සිට දෙසැම්බර් මාසවල ය.

(06) ශ්‍රී ලංකාවේ මහ කන්නයේ වගා කරන වී සහ ධාන්‍ය බෝගවල අස්වනු නෙලීම සිදු කරනුයේ,
(1) ජනවාරි, පෙබරවාරි මාසවල ය.
(2) මාර්තු, අප්‍රේල් මාසවල ය.
(3) ජූලි, අගෝස්තු මාසවල ය.
(4) සැප්තැම්බර්, ඔක්තෝබර් මාසවල ය.

(07) සාපේක්ෂ ආර්ද්‍රතාව මැනීම සඳහා භාවිතා කරන උපකරණයකි.
(1) සික්ස්ගේ උපරිම අවම උෂ්ණත්වමානය
(2) තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය
(3) සාමාන්‍ය උෂ්ණත්වමානය
(4) අනිලමානය

(08) ශ්‍රී ලංකාවේ වියළි කලාපයට අයත් ප්‍රදේශවල උච්චත්වය වනුයේ,
(1) මීටර 0 - 300කි.
(2) මීටර 300 - 500කි.
(3) මීටර 300 - 900කි.
(4) මීටර 900 - 1200කි.

(09) ශාක කුල අනුව බෝග වර්ගීකරණයේ දී සලකනු ලබන ලක්ෂණය වන්නේ,

(1) බෝග අස්වනුවල ස්වභාවයයි.
(2) ශාකයේ මල්, ඵල, පත්‍ර ආදියේ හැඩයයි.
(3) ශාකයේ ජීවිත කාලයයි.
(4) ශාකය වැඩෙන පරිසරයයි.

(10) ප්‍රයෝජන අනුව බෝග වර්ගීකරණයේ දී තෙල් ලබාගැනීමට භාවිත කරන බෝග කාණ්ඩය වන්නේ,

(1) පොල්, කුරුඳු, අඹ
(2) තල, රටකජු, සූරියකාන්ත
(3) බඩ ඉරිගු, සෝගම්, උඳු
(4) උඳු, එඬරු, අබ

(11) බීජවල සුප්ත්තාව ඉවත් කිරීම සඳහා සිටුවීමට පෙර බීජවලට සිදුකරනු ලබන ප්‍රතිකාර විධි කිහිපයක් පහත දක්වේ.

A - බීජාවරණය පළුදු කිරීම
B - නිශේදක ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ජලයෙන් සෝදීම
C - ජලයේ පෙඟවීම
D - බීජ ආමුකුලනය

ඉහත A, B, C හා D සඳහා සුදුසු බීජ විය හැක්කේ, පිළිවෙළින්,

(1) අඹ, තක්කාලි, බණ්ඩක්කා, රනිල බීජ
(2) රනිල බීජ, බණ්ඩක්කා, අඹ, තක්කාලි
(3) තක්කාලි, රනිල බීජ, අඹ, බණ්ඩක්කා
(4) බණ්ඩක්කා, තක්කාලි, රනිල බීජ, අඹ

(12) බල්බ, රෛසෝම, මොරෙයියන්, ධාවක යන වර්ධක ප්‍රචාරණ ව්‍යූහ අඩංගු ශාක පිළිවෙළින් අඩංගු පිළිතුර තෝරන්න.

(1) කෙසෙල්, ඉඟුරු, ස්ට්‍රෝබෙරි, අර්තාපල්
(2) රතුළූණු, ඉඟුරු, කෙසෙල්, ස්ට්‍රෝබෙරි
(3) ගොටුකොළ, කෙසෙල්, අන්නාසි, ස්ට්‍රෝබෙරි
(4) ඉඟුරු, රතුළූණු, කෙසෙල්, අර්තාපල්

(13) දඩු කැබලිවල මුල් ඇදීම වේගවත් කර ගැනීම සඳහා වඩාත් ම යෝග්‍ය වන්නේ,

(1) වැලි තවානක් ය.
(2) දැල් ගෘහයක් ය.
(3) සූර්ය ප්‍රචාරකයක් ය.
(4) කුට්ටි තවානක් ය.

(14) 

රූප සටහනේ දැක්වෙන බද්ධ ක්‍රමය විය හැක්කේ,

(1) ස්ටෝන් බද්ධයයි.
(2) ආරුක්කු බද්ධයයි.
(3) පැලුම් රිකිලි බද්ධයයි.
(4) H බද්ධයයි.

(15) ශාක බද්ධ කිරීම සම්බන්ධව ප්‍රකාශ තුනක් පහත දක්වේ.

A - ග්‍රාහක ශාකයක මනාව පැතුරුණු මූල මණ්ඩලයක් තිබිය යුතු ය.
B - බද්ධ පැල මගින් මව් ශාකයේ ලක්ෂණ ලබාගත හැකි ය.
C - බද්ධයක දී යොදා ගන්නා අංකුරය හෝ රිකිල්ල ග්‍රාහකය ලෙස හඳුන්වයි.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) A පමණි.
(2) C පමණි.
(3) A හා B පමණි.
(4) B හා C පමණි.

(16) තවාන් පාත්තියක පසට යෙදීමට සුදුසු ම දිලීර නාශකය තෝරන්න.

(1) ෆැරකොට් ය.
(2) කැප්ටාන් ය.
(3) ග්ලයිපොසේට් ය.
(4) බෝර්ඩෝ මිශ්‍රණය ය.

(17) ගෙවතු වගාව සඳහා තවාන් වලින් පැල ගලවා ගැනීමේ දී මූල පද්ධතියට හානි සිදුවේ. මෙම තත්ත්වය වළක්වා ගැනීමට යොදා ගන්නා උපක්‍රමය වනුයේ,

(1) තවාන් පෙට්ටි භාවිතයයි.
(2) ඩැපොග් තවාන් භාවිතයයි.
(3) නොරිඩෝකෝ තවාන් භාවිතයයි.
(4) ගිල් වූ තවාන් භාවිතයයි.

(18) තුන් පුරුක් කල්ටිවේටරය නමැති උපකරණය යොදා ගනුයේ,

(1) ප්‍රාථමික බිම් සැකසීමට ය.
(2) ද්විතියික බිම් සැකසීමට ය.
(3) අතුරුයත් ගෑමට ය.
(4) පස මට්ටම් කිරීමට ය.

(19) වගා බිම් සැකසීමේ අරමුණු කිහිපයක් පහත දක්වේ.

A - වල්පැළෑටි පාලනය කිරීම
B - කාබනික ද්‍රව්‍ය පසට මිශ්‍ර කිරීම
C - පසේ ජල වහනය අඩු කිරීම
D - පාංශු වාතනය දියුණු කිරීම

ඉහත ප්‍රකාශවලින් සත්‍ය වනුයේ,

(1) A, B, C පමණි.
(2) A, B, D පමණි.
(3) B, C, D පමණි.
(4) A, C, D පමණි.

(20) පැපොල් ගෙඩි ඉදුණු පළතුරු ලෙස ඇත ප්‍රදේශයක පිහිටි වෙළඳපොළකට ප්‍රවාහනය කිරීමේ දී ඒවා නෙලා ගත යුත්තේ,

(1) පිටපොත්ත 20%ක් පමණ කහ පැහැ වූ විට ය.
(2) පිටපොත්ත 50%ක් පමණ කහ පැහැ වූ විට ය.
(3) ගෙඩි විශාලත්වයෙන් වැඩි වූ විට ය.
(4) පොත්තේ තද කොළ පැහැය පවතින විට ය.

(21) ආහාර සැකසීමේ දී සිදුවන රසායනික වෙනස්කමක් ලෙස සැලකිය නොහැක්කේ,

(1) සැකසූ ආහාරයේ පෝෂණ ගුණය වෙනස්වීමයි.
(2) කපාගත් ආහාර ද්‍රව්‍ය එන්සයිම හේතුවෙන් දුඹුරු පැහැවීමයි.
(3) සැකසූ ආහාරයේ ආම්ලිකතාව වෙනස්වීමයි.
(4) ආහාර ද්‍රව්‍යයේ වයනය වෙනස්වීමයි.

(22) දුම් ගැසීම මගින් පරිරක්ෂණය කරගත හැකි ආහාර කාණ්ඩය වනුයේ,

(1) එළවළු, ධාන්‍ය, පලතුරු
(2) ගොරකා, පොල්, සුදුළූණු
(3) මස්, පලතුරු, එළවළු
(4) පලතුරු, ගොරකා, බේකරි නිෂ්පාදන

(23) ජෑම්, අච්චාරු, සෝස් වර්ග ඇසිරීමට බහුලව යොදා ගැනෙනුයේ,

(1) වීදුරු බඳුන් ය.
(2) ප්ලාස්ටික් බඳුන් ය.
(3) පොලි එතිලින් ටෙට්‍රාතැලේට් බඳුන් ය.
(4) ලැමිනේට් ප්ලාස්ටික් බඳුන් ය.

(24) එළවළු හා පලතුරු අස්වැන්නේ වැඩි ප්‍රමාණයක් නාස්ති වනුයේ,

(1) අස්වනු නෙලීමේ දී ය.
(2) අස්වනු නෙලීමට පෙර ක්ෂේත්‍රයේ දී ය.
(3) නුසුදුසු ඇසුරුම් හා ප්‍රවාහනයේ දී ය.
(4) පරිභෝජනයට ගන්නා අවස්ථාවේ දී ය.

(25) බ්ලාන්චිකරණය යනු,

(1) ආහාර ද්‍රව්‍යයට රසකාරකයක් එකතු කිරීමයි.
(2) සෙන්ටිග්‍රේඩ් අංශක 100ට අඩු උෂ්ණත්වයක ආහාර වැඩි වේලාවක් තැබීමයි.
(3) සෙන්ටිග්‍රේඩ් අංශක 100 උෂ්ණත්වය සහිත ජලයේ ආහාර ද්‍රව්‍ය විනාඩි 2-3ක් ගිල්වා තැබීමයි.
(4) ආහාර ද්‍රව්‍ය ලුණු ද්‍රාවණයක ගිල්වා තැබීමයි.

(26) ශෂ්‍යමාරු ගොවිතැන ලෙස සිදුකරන සිව්බෝග මාරු ක්‍රමයේ දී එක් බෝග වර්ගයක් ලෙස රනිල බෝගයක් වැවීම සිදුකරයි. මෙයින් බලාපොරොත්තු වන්නේ,

(1) පසෙන් වැඩිපුර නයිට්‍රජන් අවශෝෂණය කර ගැනීමයි.
(2) පාංශු වාතයේ ඇති නයිට්‍රජන් ශාක මූල්වල තිර කර ගැනීමයි.
(3) අස්වනු නෙලීමේ දී පස බුරුල් වීමයි.
(4) පසේ ගැඹුරු ස්ථරවලින් පෝෂක උරාගැනීමයි.

(27) එල දරන පොල් වගාවක භූමියේ පවතින ඉඩකඩෙහි පේළි ලෙස අන්නාසි වගා කර ඇත. මෙම වගා රටාව හඳුන්වනුයේ,

(1) ඒක බෝග වගාව ලෙස ය.
(2) අතුරු බෝග වගාව ලෙස ය.
(3) මිශ්‍ර බෝග වගාව ලෙස ය.
(4) කඩින් කඩ වගාව ලෙස ය.

(28) බහුස්ථර බෝග වගා පද්ධතියක නිවාස ආසන්නයේ සිටුවීමට සුදුසු බෝග කාණ්ඩය වන්නේ,

(1) එළවළු හා පලතුරු ශාකයි.
(2) එළවළු හා පලා වර්ගයි.
(3) කරාබු නැටි, ගම්මිරිස් වැනි ශාක වර්ගයි.
(4) කොස්, අඹ වැනි බෝග ශාක හා වනාන්තර ශාකයි.

(29)



රූප සටහනෙන් දැක්වෙන නිර්පාංශු වගා ක්‍රමය කුමක් ද?

(1) බඳුන් ශාක ක්‍රමයයි.
(2) එල්ලන බෑග් ක්‍රමයයි.
(3) තිරස් වගා මලු ක්‍රමයයි.
(4) මුල් ගිල් වූ වගාවයි.

(30) බෝග වගාවේ දී පාරිසරික සාධක පාලනය සඳහා ආරක්ෂිත ව්‍යුහ භාවිත කරයි. මෙසේ තැනූ දැල් ගෘහයකින් ප්‍රධාන ලෙසට පාලනය වන දේශගුණික සාධක වනුයේ,

(1) ආලෝකය හා ආර්ද්‍රතාවයයි.
(2) ආලෝකය හා සුළඟයි.
(3) සුළඟ හා වර්ෂාවයි.
(4) වර්ෂාව හා ආර්ද්‍රතාවයයි.

(31) ගොවි මහතෙක් තම කුඹුරේ ගොයම් කරල් විශාල ප්‍රමාණයක් පහතට නොනැමී, බොල් බවට පත් වී, කෙලින් ම තිබෙනු නිරීක්ෂණය කරන ලදී. ඔහුගේ කුඹුරට යාබද ඕවිටක සිටුවා තිබූ වම්බටු පත්‍ර නාරටි ඉතිරි වී දැලක් ආකාරයට දක්නා ලදී. වී වගාවට හා වම්බටු වගාවට හානිකල මෙම කෘමීන් දෙදෙනා වනුයේ පිළිවෙළින්,

(1) ගොයම් මැස්සා හා අවුලකපෝරා ය.
(2) ගොයම් පැල මැක්කා හා අවුලකපෝරා ය.
(3) ගොයම් මැස්සා හා එපිලැක්නා ය.
(4) ගොයම් පැල මැක්කා හා එපිලැක්නා ය.

(32) ශාකවලට ඇතිවන වෛරස් රෝග වලට පොදු වූ රෝග ලක්ෂණයකි.

(1) ප්‍රාදේශික පුල්ලි ඇතිවීම හා පිළිකා ඇතිවීම
(2) නාරටි බේරීම හා විචිත්‍ර ලක්ෂණ
(3) සනාල මැලවීම හා මෘදුකුණු වීම
(4) අංගමාරය හා ගැට ඇතිවීම

(33) ගොවි මහතෙක් තම වගා බිමේ හොඳින් පස පෙරලීමත්, ගිනි තැබීමත්, පිරිසිදු රෝපණ ද්‍රව්‍ය භාවිතයත්, වල්පැල මතු වූ පසු උදළු ගෑමත් සිදුකරලී ය. මෙහි දී සිදුකර ඇති වල් පැළැටි පාලන ක්‍රම වනුයේ,

(1) ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම හා යාන්ත්‍රික ක්‍රමයි.
(2) යාන්ත්‍රික ක්‍රම හා ජෛව විද්‍යාත්මක ක්‍රමයි.
(3) ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම හා ජෛව විද්‍යාත්මක ක්‍රමයි.
(4) යාන්ත්‍රික ක්‍රම හා රසායනික පාලනයයි.

(34) පහත දක්වෙන ප්‍රකාශ හොඳින් කියවන්න.

A - දාස්පෙතියා, කොහොඹ කොළ ආදියෙන් දුම් ඇල්ලීමෙන් ඉල් මැස්සන් පාලනය කළ හැකි ය.
B - ග්‍රැමොක්සෝන් යනු සියල්ල නසන වල් නාශකයකි.
C - වෛරස් රෝග වාහකයක් මගින් පැතිරෙයි.
D - LD50 අගය වැඩි පලිබෝධ නාශකවල විෂ බව වැඩි ය.

මේ අතරින් නිවැරදි ප්‍රකාශ අඩංගු පිළිතුර තෝරන්න.

(1) A, B, D පමණක් නිවැරදි ය.
(2) A, B, C පමණක් නිවැරදි ය.
(3) B, C, D පමණක් නිවැරදි ය.
(4) A, B, C, D යන සියල්ල නිවැරදි ය.

(35) අප රටෙහි දිගුම දිවා කාලයක් පවතින්නේ ජුනි 21 දින වන අතර, එය පවතින කාල සීමාව පහත සඳහන් කවරක් ද?

(1) පැය 12 මිනිත්තු 20
(2) පැය 12 මිනිත්තු 10
(3) පැය 5 මිනිත්තු 10
(4) පැය 12 මිනිත්තු 30

(36) පසක PH අගය 4.5 ක් වන විට පසෙහි ගුණත්වය

(1) භාෂ්මික ය.
(2) උදාසීන ය.
(3) ආම්ලික ය.
(4) ඉහත කිසිවක් නොවේ

(37) බීජ ප්‍රරෝහණය උත්තේජනය කරන රසායනික සංයෝග උත්තේජක නම් වේ. එවැනි උත්තේජකයක් වනුයේ,

(1) කුමරින් ය.
(2) ඇබ්සිසික් අම්ලය යි.
(3) සයිටොකයිනින් ය.
(4) ෆීනෝලික සංයෝග යි.

(38) ශාකවල වර්ධක සෛල බෙදීම හා විශේෂණය වී මව් ශාකයට සමාන නව ශාක ඇති වූ විට එය කුමන නමකින් හඳුන්වයි ද?

(1) බද්ධ කිරීමක් ලෙස ය.
(2) ක්ලෝනයක් ලෙස ය.
(3) ලේයරයක් ලෙස ය.
(4) කප්පාදු කිරීමක් ලෙස ය.

(39) බෝග වගාවේ දී, බෝගයට උචිත පරිදි අවශ්‍ය ප්‍රමාණයට පමණක් බිම් සැකසීම පහත සඳහන් කවර නමකින් හඳුන්වයි ද?

(1) උපරිම බිම් සැකසීම
(2) අවම බිම් සැකසීම
(3) ශූන්‍ය බිම් සැකසීම
(4) ඉහත සියල්ලම ය.

(40) වගා භූමියක ඇති අතිරික්ත ජලය ක්‍රමවත්ව ක්ෂේත්‍රයෙන් බැහැර කිරීම

(1) ජල සම්පාදනය නම් වේ.
(2) භූතල ජල සම්පාදනය නම් වේ.
(3) ජල වහනය නම් වේ.
(4) භූගත ජල සම්පාදනය නම් වේ.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Province Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
Second Term Evaluation

ශ්‍රේණිය / தரம் / Grade	විෂයය / பாடம் / Subject	පත්‍රය / வினாத்தாள் / Paper	කාලය / காலம் / Time
11	කෘෂි හා ආහාර තාක්ෂණය	II	පැය 02

සැලකිය යුතුයි.

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.

(01) 'ගොවිබිමට අරුණළු' වැඩ සටහන යටතේ පාසල් අතර ගෙවතු වගා තරඟයක් පැවැත්වීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා යෝජනා කළේ ය. තවාන් පාත්ති, කෙටි කාලීන බෝග, පළිබෝධ මර්ධනය, පරිසර සංරක්ෂණය සහ පොහොර භාවිතය පිළිබඳව ඇගයීමට ලක් කෙරෙන බව වැඩිදුරටත් පැවසීය. විශාල වගා භූමි ප්‍රමාණයක් ඇති මහසෙන් මැදි මහ විදුහල ද මෙම තරඟයට ඉදිරිපත් වීමට අදහස් කෙරී ය.

(1) මෙම විදුහලේ විශාල ඉඩමේ බිම් සැකසීමට පහත නගුල භාවිතයට ගන්නා ලදී.



(a) මෙම නගුල කුමක් ද?

(b) මෙය භාවිතයේ වාසි 2ක් සඳහන් කරන්න.

(2) මිනිස් බලයෙන් ක්‍රියාකරවන බිම් සැකසීමට යොදා ගත හැකි උපකරණ 2ක් සඳහන් කරන්න.

(3) වර්තමානයේ මිල ඉහළ ගොස් ඇති කෘෂිකාර්මික යෙදවුම් 2 ක් නම් කරන්න.

(4) පූර්ණ පොහොර මිශ්‍රණයක අනිවාර්යයෙන් ම අඩංගු විය යුතු මූල ද්‍රව්‍ය 03ක් නම් කරන්න.

(5) (a) වෙළෙඳපලේ ඇති මිශ්‍ර පොහොර වර්ගයක් හා අමිශ්‍ර පොහොර වර්ගයක් නම් කරන්න.

(b) අමිශ්‍ර පොහොර භාවිතයෙන් වාසියක් ලියන්න.

(6) පාසල් ගෙවත්තකට සුදුසු බෝග වගා රටාවක් නම් කරන්න.

(7) ඉහත වගා රටාව සඳහා යොදා ගත හැකි බෝග 4ක් නම් කර ඒවා අයත් වන ශාක කුල ලියා දක්වන්න.

(8) සිසුන් විසින් සකසන ලද තවාන් වලට වැළදිය හැකි දිලීර රෝගයක් හා එම රෝගය සාදන දිලීර විශේෂයක් නම් කරන්න.

(9) මෙම පාසල් භූමියෙහි පසෙහි PH අගය 5 නම් එය වගාවට සුදුසු පරිදි සකස් කිරීමට පසට යෙදිය යුතු ද්‍රව්‍යයක් නම් කරන්න.

(10) මෙම බෝගවලට යොදන ලද ජලය සංරක්ෂණය කිරීම සඳහා උපයෝගි කර ගත හැකි ක්‍රම 2ක් සඳහන් කරන්න.

(02) බණ්ඩක්කා ශාකයක පත්‍ර කහ පාට වී, නාරටි බේරි, කරල් කුරු වී ඇති ආකාරයක් දක්නට ලැබුණි.

(1) (a) මෙම පැළයට වැළඳී ඇති රෝගය කුමක් විය හැකි ද?

(b) මෙම රෝගයේ රෝග කාරකයා කුමක් ද?

(c) මෙම රෝගය ක්ෂේත්‍රයේ ව්‍යාප්ත වන්නේ කෙසේ ද?

(d) බණ්ඩක්කා වගාව බේරා ගැනීමට එම පැලයට කුමක් කළ යුතු ද?

(2) (a) කෘමි සතුන්ගෙන් බෝගවලට හානි විය හැකි ආකාර 2ක් ලියන්න.

(b) කෘමීන් නොවන පළිබෝධකයන් 2ක් නම් කරන්න.

(3) (a) පළිබෝධ පාලනයට යොදා ගන්නා ජෛව විද්‍යාත්මක ක්‍රමවලට උදාහරණ 2ක් ලියන්න.

(b) ජෛව පළිබෝධ පාලනයේ වාසියක් සඳහන් කරන්න.

...වල දී මුහුණ පෑමට සිදුවන ප්‍රධාන ගැටළුවකි. වගා
(03) වගා බිමේ ජලය හිඟ වීම හෝ අතිරික්තව පැවතීම වගා කටයුතු ...බාගත හැකි ය.
බිමක නිසි ජල කළමනාකරණයක් අඛණ්ඩව පවත්වා ගැනීමෙන් ඉහළ අස්වනු ...

(1) (a) ප්‍රධාන වශයෙන් පසෙන් ජලය ඉවත්වන ක්‍රම 2ක් නම් කරන්න.

(b) පසේ ජලය හිඟ වූ විට බෝගයක ඇති විය හැකි ගැටලු තත්ත්ව 2ක් සඳහන් කරන්න.

(2) (a) කාලය ශ්‍රමය අඩුවෙන් භාවිත කළ හැකි ජල සම්පාදන ක්‍රමයක් නම් කරන්න.

(b) ඉහත ජල සම්පාදන ක්‍රමය කුමන බෝගයකට සුදුසු වේ ද?

(c) ඉහත ජල සම්පාදන ක්‍රමයේ අවාසි 2ක් සඳහන් කරන්න.

(3)



(a) මෙය කුමන ජල සම්පාදන ක්‍රමයක් ද?

(b) මෙහි වාසියක් හා අවාසියක් සඳහන් කරන්න.

(c) මෙම ජල සම්පාදන ක්‍රමය සුදුසු බෝග 2ක් සඳහන් කරන්න.

(04) පාසල් වත්තේ පහත සඳහන් වල් පැළෑටි හටගෙන තිබෙනු දක්නට ලැබුණි.

(1) කළාදුරු (2) ඇටවරා (3) කුප්පමේනියා (4) පොල්පලා
(5) ගඳපාන (6) බැලතණ (7) තුනැස්ස

(1) (a) රූපීය ලක්ෂණ අනුව මෙම වල් පැළෑටි කාණ්ඩවලට වෙන්කර දක්වන්න.

(b) වල් පැළෑටිවල විශේෂ ලක්ෂණ 4ක් ලියන්න.

(2) (a) වල් පැළෑටි පාලනයට යොදා ගන්නා යාන්ත්‍රික ක්‍රම 2ක් නම් කරන්න.

(b) පාංශු බාදනය වැළැක්වීම සඳහා වල් පැළෑටි යොදා ගත හැකි ආකාරය විස්තර කරන්න.

(3) බෑවුම් සහිත භූමියක පාංශු සංරක්ෂණය සඳහා යොදා ගත හැකි යාන්ත්‍රික ක්‍රම 2ක් නම් කළ රූප සටහන් ඇසුරින් දක්වන්න.

(05) ආහාර ද්‍රව්‍ය නිසි පරිදි පරිරක්ෂණය කර නරක් වීම වළක්වා ගැනීම මගින් විශාල ලෙස ආර්ථික වාසි ලබාගත හැකි ය.

(1) (a) ආහාර පරිරක්ෂණයේ වැදගත්කම් මොනවා ද?

(b) නැවුම් කිරි පරිරක්ෂණය සිදු කළ හැකි ක්‍රම 2ක් නම් කරන්න.

(2) (a) ආහාර පරිරක්ෂණය සඳහා යොදා ගන්නා ක්‍රම 2ක් සඳහන් කර ඒවාට උදාහරණ 2 බැගින් දක්වන්න.

(b) ආහාර සැකසීම හා පරිරක්ෂණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද?

(3) (a) ආහාර ද්‍රව්‍ය ඇසුරුම්ක ලේබලයෙහි අඩංගු විය යුතු කරුණු මොනවා ද?

(b) වේළෙඳ පොළේ ආහාරවල රස ප්‍රවර්ධනය කිරීම සඳහා බහුලව භාවිත කරන රසායනික ද්‍රව්‍යයක් නම් කරන්න.

(06) ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරු අස්වැන්නෙන් 40% - 60% ප්‍රමාණයක් අපතේ යන බව වාර්තාවලින් හෙලි වී ඇත.

(1) (a) බෝග වගාවේ දී සිදුවන පෙර අස්වනු හානි මොනවා ද?

(b) එම හානි වලක්වා ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග මොනවා ද?

(c) එළවළු අස්වනු නෙලීමට වඩාත් සුදුසු වන්නේ දවසේ කුමන වේලාවක් ද?

(2) (a) අස්වනුවලට ප්‍රවාහනයේ දී සිදුවන හානි අවම කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග මොනවා ද?

(b) පළතුරු ගබඩා කිරීමේ දී උණුසුම් ජල ප්‍රතිකාරය කිරීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද?

(3) (a) පළතුරු නිෂ්පාදන ඇසිරීම සඳහා යොදා ගැනෙන බෝතල් ජීවානුහරණය කරගනු ලබන ක්‍රමයක් කෙටියෙන් විස්තර කරන්න.

(b) ජෑම්/කෝඩියල් සෑදීමේ දී යොදා ගැනෙන පරිරක්ෂක ද්‍රව්‍යයක් නම් කරන්න.

(07) පස ජලයෙන් සංතෘප්ත වන විට පාංශු වාතය ඉවත් වේ. ජලය සපයා පැය 48කින් පමණ අතිරික්ත ජලය බැස ගිය පසු පාංශු ජලය බෝග වගාවට ඉතාමත් හිතකර තත්ත්වයට පත්වේ.

(1) (a) **මෙම තෘප්ත්වයේ ඇති පස භඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?**

(b) පාංශු ජලය පසේ පවතින ආකාර නම් කරන්න.

(c) බෝග වගාවේ දී පාංශු වාතයෙන් ඇති ප්‍රයෝජන 2ක් ලියන්න.

(2) (a) පාංශු කාබනික ද්‍රව්‍ය තිබීමෙන් ලැබෙන ප්‍රයෝජන 2ක් ලියන්න.

(b) පසේ ජීවත්වන පාංශු ක්ෂුද්‍ර ජීවී කාණ්ඩ 2ක් නම් කරන්න.

(c) බෝග වගාවේ දී පාංශු ක්ෂුද්‍ර ජීවීන්ගේ ඇති ප්‍රයෝජන 2ක් ලියන්න.

(3) (a) පාංශු පැතිකඩක දළ රූප සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න.

(b) පාෂාණ වර්ග 2ක් නම් කර, ඒවාට උදාහරණය බැගින් ලියන්න.

The National e-learning Portal for The General Education